
# 17

# වාක්කෝෂය පෝෂණය

භාෂාවකින් සන්නිවේදනය වන්නේ අදහස් ය. අදහස් සැකසෙන්නේ වාක්‍යවලිනි. වාක්‍ය සම්පූර්ණ වන්නේ වචනවලින් ය. භාෂාවක වචන මාලාව පොහොසත් වන්නේ යම් තරමකට ද එම භාෂාව ඒ තරමට ම පොහොසත් ය. සිංහල භාෂාව ද ලෝකයේ පවතින භාෂා අතර පොහොසත් භාෂාවකි. සිංහල වචන මාලාවේ පොහොසත්කම ඊට හේතුව යි. ඒ පොහොසත්, සිංහල වචන මාලාව කෙසේ සකස් වී දැ යි, කෙසේ පෝෂණය වී දැ යි සොයා බැලීම **වාක්කෝෂය පෝෂණය** පාඩමෙන් අපේක්ෂා කෙරේ.

# අපූරු ඉගෙනීමක්




"ආ....... මෙන්න පොඩි නමට ලියුමක් එවල, අරක්ගහ නායක හාමුදුරුවො......."

සිරි ධම්මවාස මහ පිරිවෙණේ කෘත්‍යාධිකාරි පූජ්‍ය පඹුරේ ආනන්ද ලොකු හාමුදුරුවන් වහන්සේ තම ශිෂ්‍ය පීතිපුර සුනන්ද පොඩි හාමුදුරුවන් අමතා උන්වහන්සේ නමට ආ ලිපියක් එසේ බාර දුන්හ.

ප්‍රීතිපුර සුනන්ද පොඩි හාමුදුරුවෝ සිරි ධම්මාවාස පිරිවෙණේ 5 වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යවරයෙකි. පිරිවෙණේ ගුරු-ශිෂ්‍ය දෙපිරිසේ ම ආදරය, ගෞරවය දිනා සිටි උන්වහන්සේ, ආයතනික වත්පිළිවෙත්වලත් විෂය බාහිර ක්‍රියාකාරකම්වලත් මැනවින් නිරත වෙමින් ඉගෙනීමට ම අවධානය යොමු කර සිටින ශිෂ්‍ය හිමිනමකි. ඉගෙනීමේදී උන්වහන්සේට ඇතිවන ගැටලු නිරාකරණය කර ගන්නේත්, යම් අලුත් තොරතුරක් දැනගැනීමට අවශ්‍ය වූ විට එය දැනගන්නේත් පූජ්‍ය අරක්ගහ දේවින්ද හාමුදුරුවන් වහන්සේගෙනි. නායක හාමුදුරුවෝ මුළු සාමපුර පළාතේ ම සිටින රාජකීය පණ්ඩිත උපාධිය හිමි කර ගත් එක ම යතිවරයාණෝ ය. සාමපුර පළාතේ ඕනෑ ම අයෙකුගේ ආගමික, ජාතික ආධ්‍යාපනික අවශ්‍යතාවක් ඇතොත් ඒවා සපුරාලන්නේ නිහතමානීව ම ය.

ප්‍රීතිපුර සුනන්ද පොඩි හාමුදුරුවෝ "**වාක්කෝෂය පෝෂණය**" පිළිබඳ තොරතුරු විමසා අරක්ගහ නායක හාමුදුරුවන්ට යවන ලද ලිපියට පිළිතුරු ලිපිය යැයි සිතා තමන්ට ලොකු හාමුදුරුවන් වහන්සේ ලබා දුන් ලිපිය විවර කළේ අතිශය සතුටිනි. එය කියවා අවසන් වන තුරු උන්වහන්සේට ඉවසුම් නැති විය. උන්වහන්සේ ඒ ලිපිය මෙසේ කියවන්නට පටන් ගත්හ.

2017-07-08

සුනන්ද පොඩි නම වෙත මෙත් සිතිනි,

ඔය නම අසා එවල තිබුණා නේද **වාක්කෝෂය පෝෂණය** කියන්නෙ මොකක්ද කියලා?

පොඩිනම, ඕනෑ ම ජාතියක් තම අදහස් සන්නිවේදනය කර ගැනීම සඳහා භාෂාව යොදා ගැනීමේදී වචන මාලාවක් පාවිච්චි කරනවා. වාක්කෝෂය කියන්නෙ ඒ වචන මාලාවට. එය, යම් ජාතියක් පහළ වීමත් සමග සම්පූර්ණ වී සැකසෙන්නක් නොවේ. ජාතියක් අන්‍ය ජාතීන් හා ඇතිකර ගන්නා සංස්කෘතික, සමාජ, ආර්ථික, දේශපාලනික සම්බන්ධතා මත ක්‍රමයෙන් වර්ධනය වී සකස් වන දෙයක්.

මුලින් තමන් භාවිත කළ වචන මාලාවට වෙනත් භාෂාවන්ගෙන් විවිධාකාරව වචන එක් වී භාවිතයට ඒම **වාක්කෝෂය පෝෂණය** හැටියට සඳහන් කරන්න පුළුවනි. ඕනෑ ම ජීව භාෂාවක මෙය දකින්න තිබෙන දෙයක්.

ඒ ආකාර කුමන හෝ භාෂාවක පවතින වාක්කෝෂය නැත්නම් වාග්මාලාව කොටස් තුනකට බෙදා දැක්විය හැකි ය.

1. නිෂ්පන්න
2. තත්සම
3. තද්භව

## 1. නිෂ්පන්න

නිෂ්පන්න යනු දේශයෙහි උපන් යන අර්ථය යි. ජාතියක සන්නිවේදන අවශ්‍යතාව උදෙසා ඒ ඒ දේශයන්හි හටගෙන පැවත එන වාග්මාලාව නිෂ්පන්න වාක්කෝෂය යි. දේශජ වාග්මාලාව ලෙස ද මෙය හැඳින්වේ. ''**කිසි අන්බසින් නුමුසු හෙළ දිවැ පළ නිපන් නම්**'' කිසියම් අන්‍ය භාෂාවකින් මිශ්‍ර නොවී හෙළ දිව ම පහළ වූ වදන් නිෂ්පන්න වේ යනුවෙන් සිදත් සඟරාවේ දැක්වූයේ මෙය යි. ලෝකයේ සෑම භාෂාවක ම පාහේ නිෂ්පන්න වාක්කෝෂයක් දකින්න තිබෙනවා.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ආදියේ (මුල් කාලීන) සිට පැවත ආ **යක්ෂ, රාක්ෂස, දේව, නාග** වශයෙන් වූ ගෝත්‍රික ජන කොටස් භාවිත කළ වාග්මාලාව ලංකාවේ නැත්තම් සිංහල දේශයේ නිෂ්පන්න වාක්කෝෂයට අයත් වෙනවා.

ඒ අතීත ශ්‍රී ලාංකිකයින් සරල ජීවන රටාවක් මෙන් ම සීමා සහිත ව පැතිර ගිය සමාජ සංස්කෘතික හර පද්ධතියක් ඇති ව සිය ජනජීවිතය පවත්වාගෙන ගිය පිරිසකි. ඒ නිසාම ඔවුනට සන්නිවේදන කාර්යය සඳහා එතරම් පැතිර ගිය වාක්කෝෂයක් අවශ්‍ය වූයේ නැත. ඔවුනගේ වාක්කෝෂය සීමිත වූයේ ඒ නිසා ය. එහෙත් ඔවුනගේ දෛනික අවශ්‍යතා සියල්ල ඉටු කර ගැනීම සඳහා ඒ වාක්කෝෂය ප්‍රමාණවත් විය. පහත සඳහන් වන්නේ ඒ ආදි සිංහලයන් භාවිත කළ වාක්කෝෂයට අයත් නිදසුන් කිහිපයක්.

**නොයෙක් වස්තු හා ස්ථාන කියවෙන නාම**

| | | |
|---|---|---|
| විල | තැන්න | ළැම |
| වෙල | ගොඩ | රුවල |
| කන්ද | සුළඟ | ළිප |
| ලන්ද | එළිය | ගෙඩිය |
| කැලෑව | වතුර | ලෑල්ල |
| බැද්ද | ඔරුව | පිහිල්ල |
| නාය | පාරුව | වෑය |
| | ළිඳ | බඩ |
| | පැල | කට |

**වෘක්ෂලතා නාම**

| | | |
|---|---|---|
| කොස් | කොබෝලීල | දෙල් |
| කොහොඹ | පොල් | දිවුල් |
| කදුරු | මුරුත | හොර |
| වෙරළු | මොර | ගොරක |

**තිරිසනුන්ගේ නාම**

| | | |
|---|---|---|
| අලියා | උරුලෑවා | කොටියා |
| ඉත්තෑවා | බල්ලා | කැනහිලා |
| රිළවා | ලෙහෙනා | ගෙරියා |
| කබල්ලෑවා | උගුඩුවා | කලවැද්දා |
| මුගටියා | හම්බාවා | |

**උරග නාම**

| | | |
|---|---|---|
| පිඹුරා | පොළඟා | ගැරඬියා |
| මාපිලා | කටුස්සා | හූනා |

**පක්ෂි නාම**

| | | |
|---|---|---|
| උකුස්සා | කොබෙයියා | උලමා |
| බටගොයා | කොරවක්කා | බස්සා |

**කෘමි සතුන්ගේ නාම**

| | | |
|---|---|---|
| පළඟැටියා | වේයා | සමනලයා |
| කඩියා | දෙබරා | කෝදුරුවා |
| මදුරුවා | | |

**මත්ස්‍ය නාම**

| | | |
|---|---|---|
| ලූලා | මගුරා | කොරලියා |
| කාවයියා | තෝරා | මෝරා |
| හුරුල්ලා | | බෝල්ලා |
| පරවා | | |

**ක්‍රියාවාචික ශබ්ද (ධාතු)**

| | | | |
|---|---|---|---|
| අඬ | (ඇඬීමෙහි) | අන | (ඇනීමෙහි) |
| ඇද | (ඇදීමෙහි) | ඉල්ව | (ඉල්ලීමෙහි) |
| උසුල | (ඉසිලීමෙහි) | රවට | (රැවටීමෙහි) |
| පෙර | (පෙරීමෙහි) | දවට | (දැවටීමෙහි) |
| කොඳුර | (කෙඳිරීමෙහි) | එළඹ | (එළඹීමෙහි) |
| එළව | (එළවීමෙහි) | ඔරව | (එරවීමෙහි) |

**වෙනත් විවිධ නාම**

| | | |
|---|---|---|
| පොරය | හටන | රැහැන |
| උරණ | බොළඳ | ළමයා |
| ළඳ | ලුහුඬු | ලෙහෙසි |
| බිළිඳා | බුරුල් | සිහින් |
| එරෙහි | හුග | තරහ |
| හපනා | නැඹුල් | |

## 2. තත්සම

සුනන්ද පොඩි නම,

මම මෙතෙක් විස්තර කරල දුන්නෙ ආදි ශ්‍රී ලාංකිකයින් (ස්වදේශිකයන්) භාවිත කළ මූලික වාක්කෝෂය යි. එය පෝෂණයට බලපෑ වාග්කෝෂ දෙකක් තිබෙනව, **තත්සම** හා **තත්භව** කියලා.

මෙහි **තත්සම** වාක්කෝෂය යනු වෙනත් භාෂාවලින් ලැබී ඒ අයුරින් ම භාවිත කරන වාක්කෝෂය යි. තත්සම යන්නෙහි තිබෙන්නේ ඊට සමාන යන අර්ථය යි. මේ වාක්කෝෂයට ප්‍රධාන වශයෙන් ගැනෙන්නේ අපේ මාතෘ භාෂා ලෙස හැඳින්වෙන **පාලි, සංස්කෘත** භාෂාවන්ගෙන් ලැබුණු වාක්කෝෂය යි. ''**මග ද සකු ඈ බණ සම වූ බස තසම නම්**'' පාලි සංස්කෘත ආදි භාෂාවන් හා සමාන වූ වචන තත්සම නම් වේ යනුවෙන් එය සිදත් සඟරාවේ සඳහන් වේ. එම භාෂාවන්හි භාවිත වචන අපේ රටේදී ඒ අයුරින් ම පාවිච්චියට ඇවිත් තිබෙනවා. පාලි සංස්කෘත භාෂා හැඳින්වෙන්නේ **ආර්ය භාෂා** කියල යි. මේ නිදසුන් ටික බලන්නකො.

| | | |
|---|---|---|
| ධර්ම | ශක්ති | භය |
| අමාත්‍ය | වචන | ශල්‍ය |
| ආහාර | මන්ත්‍රී | දේශනා |
| කර්ම | විශේෂ | හෘදය |
| පුරුෂ | හස්ත | ශිල්ප |
| ගෞරව | ගෘහය | පාද |
| ශාස්ත්‍ර | ලෝක | ස්ත්‍රී |
| ජීව | අධිපති | භූමි |
| කථා | උත්සව | අධිකාරි |
| වර්ෂා | | |

**අනාර්ය** භාෂාවක් ලෙස හැඳින්වෙන **ද්‍රවිඩ** භාෂාවෙන් ලැබුණු වචනවලින් ද නිෂ්පන්න වාක්කෝෂය පෝෂණය වෙලා තිබෙනවා.

| | | |
|---|---|---|
| අත්තිවාරම් | තුවක්කු | ඉලක්කම් |
| උඩැක්කි | කොත්තමල්ලි | තක්කඩි |
| තුට්ටු | හෙප්පු | තලප්පා |
| අච්චු | කිට්ටු | කට්ටකම් |
| පංගු | කුරුම්බා | පන්දම් |
| සුරුට්ටු | සීට්ටු | පිට්ටු |
| මුට්ටු | කොට්ට | කුට්ටම් |
| ආප්ප | ඉඩම් | |

ඒ වගේ ම පොඩි නම,

යුරෝපීය ජාතීන් වන පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි ජාතිකයින් ලංකාවට පැමිණීමත් සමග ඔවුන් භාවිත කළ වචන ද ඒ අයුරින් ම අපේ භාෂාවට එක්වෙලා තිබෙනවා. අපේ වාක්කෝෂය පෝෂණය වීමට එම වචනත් තත්සම වශයෙන් බලපෑවා.

**පෘතුගීසි භාෂාවෙන් ලැබුණු වචන**

| | | |
|---|---|---|
| කරත්ත | කෝප්ප | පාන් |
| කසාද | ජනේල | පෙනේර |
| කලිසම් | ගෝවා | පෝරක |
| බෝනික්කා | කාමර | තුරුම්පු |
| රේන්ද | කාසි | තුවාය |
| විනාකිරි | | |

**ලන්දේසි භාෂාවෙන් ලැබුණු වචන**

| | | |
|---|---|---|
| ඉස්ත්‍රික්කය | බක්කිය | සොල්දරේ |
| ඉස්තාලය | බක්කරේ | බූදලේ |
| ඉස්තෝප්පුව | බේකරි | සූකිරි |
| කන්තෝරුව | බොයිලේරුව | බාල්ක |
| කොමසාරිස් | තප්පුව | දොයිතුව |

**ඉංග්‍රීසි භාෂාවෙන් ලැබුණු වචන**

| | | |
|---|---|---|
| ටෙලිෆෝන් | ඇපල් | ටෙලිග්‍රෑම් |
| ටොෆි | ග්‍රැමෆෝන් | බයිසිකල් |
| බස් | කාර් | |

## 3. තත්භව

අපේ වාක්කෝෂය පෝෂණය කළ අනිත් වාග්මාලාව වන්නේ **තත්භව වාක්කෝෂය යි.** තත්භව යනු එයින් බිඳුණු යන අර්ථය යි. වෙනත් භාෂාවන්ගෙන් බිඳී ඇති වචන මේ කොටසට ඇතුළත්. "**බිඳුණේ තබව නම් වේ**" යනුවෙන් සිදත් සඟරාවේ මෙය දක්වේ. මේ වචනවලින් ද වැඩි කොටසක් සැකසී තිබෙන්නේ පාලි, සංස්කෘත භාෂාවන්ගෙන් බිඳී ආ වචන ලෙස යි. මේ තිබෙන්නේ ඊට උදාහරණ ටිකක්.

| **සංස්කෘත** | | **පාලි** | | **සිංහල** |
|---|---|---|---|---|
| ධර්ම | > | ධම්ම | > | දහම්/ දම් |
| දේශනා | > | දෙසනා | > | දෙසුම් |
| කර්ම | > | කම්ම | > | කම් |

| | | | | |
|---|---|---|---|---|
| දන්ත | > | දන්ත | > | දත් |
| කෙශ | > | කෙස | > | කෙස් |
| පුස්තක | > | පොත්තක | > | පොත් |
| පෘථිවි | > | පඨවි | > | පොළොව |
| අද්‍ය | > | අජ්ජ | > | අද |
| ආකාශ | > | ආකාස | > | අහස් |
| භූමි | > | භූමි | > | බිම් |
| චෛත්‍ය | > | චෙති | > | සෑ |

පාලි, සංස්කෘත භාෂා හැරුණු කොට ද්‍රවිඩ භාෂාවෙන් බිඳී ආ වචන මාලාවකින් ද අපේ වාක්කෝෂය පෝෂණය වී තිබෙනවා. මේ වචන ටික බලන්න.

| **ද්‍රවිඩ** | | **සිංහල** |
|---|---|---|
| කරවාඩු | > | කරවල |
| තෝඩෙයි | > | දොඩම් |
| පුවාලෙයි | > | පුවාලු (කෙසෙල්) |
| කඤ්ජි | > | කැඳ |
| වාවල් | > | වවුල් |
| පිංගාන් | > | පිඟන් |
| කුඩෛ | > | කුඩ |

**ඉංග්‍රීසි භාෂාවෙන් බිඳී ආ වචන.**

| | | | | |
|---|---|---|---|---|
| Kettle | - | කෙට්ල් | > | කේතලය |
| Bottle | - | බොට්ල් | > | බෝතලය |
| Department | - | ඩිපාර්ට්මන්ට් | > | දෙපාර්තමේන්තුව |
| Conductor | - | කන්ඩක්ටර් | > | කොන්දොස්තර |
| Pencil | - | පෙන්සිල් | > | පැන්සල |
| Pen | - | පෙන් | > | පෑන |
| Parliament | - | පාර්ලිමන්ට් | > | පාර්ලිමේන්තුව |
| Engineer | = | ඉංජිනියර් | > | ඉංජිනේරු |
| Dish | = | ඩිෂ් | > | දීසිය |

මේ තොරතුරු සියල්ල ලියා අවසානයේ පොඩි නමට විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් තියෙනවා. ඒ තමයි පොඩි නම,

වර්තමානය වන විට විද්‍යා හා තාක්ෂණ ඥානයේ දියුණුවත් සමග අපූරු ලෙස ලෝකය එකට එක්වෙලා තිබෙන එක. විද්‍යා හා තාක්ෂණ ඥානයේ දියුණුවත් සමග ජාත්‍යන්තරයේ ඇති වූ නව නිර්මාණ නව සංකල්ප පාදක කර ගෙනත් අපේ වාක්කෝෂය පෝෂණය වීමට වචන රාශියක් එකතු වුණා. පොඩි නමට ඒ වචන මේ වන විට ඕන තරම් ඇහිලා ඇති. බලන්න මේ වචන හුරු ද කියලා. ඒවා ඉංග්‍රීසි භාෂාවේ බලපෑමෙන් ඇවිත් සිංහල වාක්කෝෂය පෝෂණය කර තිබෙන බව යි පෙනෙන්නේ.


| | | |
|---|---|---|
| Internet | > | අන්තර්ජාලය |
| Globalization | > | ගෝලීයකරණය |
| Computer | > | පරිගණකය |
| Face book | > | මුහුණු පොත |
| Millennium | > | සහස්‍රකය |
| Selfy | > | සෙල්ෆිය |

| | | |
|---|---|---|
| Global Village | > | විශ්ව ගම්මානය |
| Soft ware | > | මෘදුකාංග |
| Hard ware | > | දෘඪාංග |
| Web site | > | වෙබ් අඩවි |
| Hybrid | > | දෙමුහුන් |

ඉතිං පොඩි නම ඔන්න ඔය විදියට තමයි අපේ වාක්කෝෂය පෝෂණය වෙලා තිබෙන්නේ. ජාත්‍යන්තරකරණයේ නොයෙක් නොයෙක් විපර්යාස ඉදිරියේදී මීටත් වඩා වෙන්න පුළුවන්. එහෙම වෙන කොට අපේ වාක්කෝෂයටත් එය බලපාලා අපේ වාක්කෝෂය තව තවත් පෝෂණය වෙන්න හේතු වෙනවා.

මම හිතනවා පොඩිනම අහලා ඒවා තිබුණු කරුණට ගොඩාක් විස්තර ලිව්වා කියලා. මේ කරුණු හොඳින් කියවලා බලලා ඉගෙන ගෙන පොඩිනමගේත් වාක්කෝෂය පෝෂණය කරගන්න ඕනෑ.

පොඩි නමට ත්‍රිවිධ රත්නයේ ආශීර්වාදය වේවා!



.........................................................

අරක්ගහ දේවින්ද නායක ස්ථවිර

සාමපුර විජයන්ත පිරිවෙණේ දී

## ක්‍රියාකාරකම 1

- පහත සඳහන් වගු සම්පූර්ණ කරන්න.

| | පෘතුගීසි තත්සම වචන | ලන්දේසි තත්සම වචන | ඉංග්‍රීසි තත්සම වචන |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |
| 5 | | | |

- නිෂ්පන්න වාක්කෝෂය ඇසුරෙන් වචන සොයා සම්පූර්ණ කරන්න.

| | නානා වස්තු නාම | සත්ත්ව නාම | වෘක්ෂලතා නාම | ක්‍රියා මූල |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |

## ක්‍රියාකාරකම 2

I. මාතෘ භාෂාගත තත්සම වචන විස්සක් (20) ලියන්න.

II. මාතෘ භාෂාගත තත්භව වචන විස්සක් (20) ලියන්න.

## ක්‍රියාකාරකම 3

- **පැරණි ගද්‍ය පද්‍ය කෘති පරික්ෂා කොට තත්භව වචන යෙදී ඇති නිදසුන් පාඨ තෝරා එකතුවක් සකස් කරන්න.**

### iqNdIs;

**න ඉච්ඡෙය්‍ය අධම්මෙන සමිද්ධිමත්තනො**
- ධම්ම පදය -

අධර්මයෙන් තමන්ගේ වැඩි දියුණු ව නොපතනු

### iqÑka;k

අප සැලකිලිමත් විය යුත්තේ කවුරු හරි ද යන්න පිළිබඳ ව නොවේ.
කුමක් හරි ද යන්න පිළිබඳව යි.